# කොත්තු රොටි, නිව්ටෝනීය නියම හා රතු පාට

බටහිර පශ්චාත්නූතනවාදීන්ට අනුව භාෂාවේ වචන, එනම් ශබ්ද, සංඥායක ද ඉන් කියැවෙන දෙය සංඥායිතය ද වෙයි. ඔවුන්ට අනුව සංස්කෘතියෙන් සංස්කෘතියට සංඥායිතය ද වෙනස් වන නමුත් ඒ සංඥායිත සියල්ල පිටුපස ප්‍රඥප්තයක් වෙයි. මේ ප්‍රඥප්තය යන්න ආත්මවාදී බව ද එහි නිරීක්ෂකයාගෙන් ස්වායත්ත වූ ඊනියා වාස්තවිකත්වයක් ඇති බව ද බටහිරයන්ට මේ ආත්මවාදයෙන් ගැලවීමක් නොමැති බව ද අපි සඳහන් කෙළෙමු. ඊනියා ප්‍රඥප්තය පමණක් නොව මේ සංඥායක සංඥායිත ප්‍රවාදය ම වැඩකට නැති මනස්ගාතයක් පමණකි. බල්ලා යන ශබ්දය ඇසුණු විගස අපට සිංහල සංස්කෘතිය තුළ බල්ලකු යනුවෙන් හැඳින්වෙන සතකුගේ පොදු ස්වරූපය සිතට නැගෙයි. ඉංගිරිසි නොදන්නා සිංහල පමණක් දන්නා අයකුට ඩෝග් යන ශබ්දය බල්ලකු නොහඟවයි. එය හුදු ශබ්දයක් පමණක් ද? හුදු ශබ්දයක් යනු කුමක් ද? එවැනි අවස්ථාවක් දැනට පසෙකට දමන්න. බටහිර විද්‍යාවේ එන ප්‍රතික්‍රියාව යන වචනය ගන්න. නිව්ටෝනීය නියමවලින් එකකට අනුව ඕනෑම ක්‍රියාවකට සමාන හා ප්‍රතිවිරුද්ධ ප්‍රතික්‍රියාවක් වෙයි. මේ නියමය යනු ශබ්ද මාලාවක් ද? එය ශබ්ද මාලාවක් පමණක් ලෙස සලකන පිරිසක් වෙත් ද?

කුඩා ළදරුවකුට ඒ වචනවලින් කිසියම් වූ හැඟීමක් ගෙන නොදෙන්නේ ද? එය ඒ ළදරුවාට සංඥායකයක් ද? එය සංඥායකයක් වන්නේ නම් එහි සංඥායිතය කුමක් ද? එය සංඥායකයක් නොවන්නේ නම් ඒ කුමක් ද? නිව්ටන්ගේ නියම යම් ප්‍රමාණයකට ඉගෙනගත් අයකුට ඒ ශබ්ද මාලාවෙන් යමක් කියැවෙයි. නිව්ටන්ගේ නියම නොදත් අයකුට ඉන් කියැවෙන්නේ කුමක් ද? ඒ අයට ඒ වචන හුදු ශබ්ද මාලාවක් පමණ ද? භාෂාව නොදත් ළදරුවකුට ඒ වචන වලින් හැඟෙන්නට වෙනස් වුවක් භාෂාව දත් එහෙත් නිව්ටෝනීය නියම නොදත් වැඩිහිටියකුට ලැබෙයි. ඒ ශබ්ද මාලාව සමඟ යම්කිසි සන්නිවේදනයක් ද කෙරෙයි. සන්නිවේදනය කෙරෙන්නේ තොරතුරු ය. භාෂාවෙන් කෙරෙන්නේ තමාට හෝ වෙනත් අයකුට හෝ තොරතුරු සන්නිවේදනය කිරීමකි. එහෙත් මේ තොරතුරු සංස්කෘතියෙන් ස්වායත්ත නොවේ.

අපේ රටේ බොහෝ ප්‍රදේශවල කොත්තු රොටි නිෂ්පාදනය කෙරෙන අවන්හල් වෙයි. මේ අවන්හලකට ළඟාවීමට පෙර ම ඉන් නැගෙන කොත්තු රොටි නිෂ්පාදනයේ දී ඇති කෙරෙන ශබ්ද මාලාවක් ඇසෙන්නට පටන් ගනියි. එයට අපි කොත්තු ඝෝෂාව යැයි කියමු. සමහරකුට එය කොත්තු සංගීතය යැයි හැඳින්වීමට අවශ්‍ය විය හැකි නමුදු එවැනි සංගීතයක් වර්ගීකරණයකට ලක් නොවෙයි. එනම් එය උත්තර භාරතීය ද, කර්ණාටක ද, නැත්නම් බටහිර ද එසේත් නැත්නම් වෙනත් යමක් දැයි යනුවෙන් යම් වර්ගයකට දැමිය නොහැකි ය. කෙසේ වෙතත් එය කොත්තු සංගීය ලෙස හඳුන්වනවාට සංගීතඥයන්, කිනම් ගුරු කුලයක, කිනම් සම්ප්‍රදායක වුව ද අකමැති වන්නේ යැයි සිතමි. දැන් මේ කොත්තු ඝෝෂාව හඳුනාගත හැකි අයට ඉන් යමක් සන්නිවේදනය වෙයි. ඒ ඝෝෂාව බටහිරින් එන සංචාරකයනට එවැන්නක් සන්නිවේදනය නොකරයි. බටහිර සංචාරකයාට ඒ ශබ්ද මාලාව වෙනත් හැඟීමක් දනවන ඝෝෂාවකි. සංචාරකයා බුද්ධිමත් නම් ටික වේලාවකින් ඔහුට හෝ ඇයට ද ඝෝෂාව හා කොත්තු රොටි නිෂ්පදනය අතර සම්බන්ධයක් ඇති බව වැටහෙයි. නැතහොත් සංචාරකයාට එය වෙනත් අයකු විසින් කියා දෙනු ලබනු ඇත. ඒ ක්‍රියාවලියෙන් පසුව සංචාරකයාට ද කොත්තු ඝෝෂාවෙන් කලින් නොවූ යමක් සන්නිවේදනය කෙරෙයි. මෙයින් පෙනී යන කරුණ නම් යම් ශබ්ද මාලාවක් යනු කිසියම් හැඟීමක් දනවන ඝෝෂාවක් ද එසේත් නැත්නම් යමක් සන්නිවේදනය කරන්නක් ද එසේත් නැත්නම් ඒ දෙකම කරන්නක් ද යන්න තීරණය කෙරෙන්නේ යම් සංස්කෘතියක් මගින් බව ය. යමකු අදාළ සංස්කෘතිය ගැන ඒ සංස්කෘතිය තුළින් ම අවබෝධ කරගත් විට ඔහුට හෝ ඇයට ඒ සංස්කෘතියෙහි වචන හෝ වෙනත් ශබ්ද මගින් යම් යම් දෑ සන්නිවේදනය ද කෙරෙයි.

මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වෙයි. යම් යම් දෑ සන්නිවේදනය කෙරෙයි යනුවෙන් අදහස් කෙරෙන්නේ සංස්කෘතියෙන් ස්වායත්ත ව හෝ ශබ්ද මාලාවෙන් ස්වායත්ත ව හෝ පවතින, කෙටියෙන් කියන්නේ නම් නිරීක්ෂකයාගෙන් ස්වායත්ත ව පවතින යමක් සන්නිවේදනය කෙරෙන බවක් නොවේ. එසේ පවතින්නේ යැයි ගැනීම ආත්මවාදී වෙයි. නිරීක්ෂකයාගේ මැදිහත්වීමෙන් පමණක් සන්නිවේදනය සිදුවෙයි. එහි දී නිරීක්ෂකයා විසින් කෙරෙන නිර්මාණය ම සන්නිවේදනය වෙයි. බල්ලා යන්න යම් නිරීක්ෂකයකු නිර්මාණය කර ගන්නේ තම සංස්කෘතියට හා මනසට සාපේක්ෂව ය. එමෙන් ම එය නිර්මාණය වන්නේ යම් සන්දර්භයක් තුළ ය. උදාහරණ වශයෙන් ගතහොත්

© Prof. Nalin De Silva

බල්ලා සපා කෑවේ ය යන්නෙහි බල්ලා සහ ඒ මිනිහා බල්ලෙක් යන යෙදුමෙහි බල්ලා (බල්ලෙක්) යන්නෙන් කියැවෙන්නේ එකම ආකාරයේ බල්ලකු ගැන නොවේ. සංස්කෘතිය ගැන නිසි අවබෝධයක් නැත්තකුට ඒ මිනිහා බල්ලෙක් යන වචන මාලාව තුළින් සංගත යමක් නිර්මාණය කර ගැනීමට නොහැකි වෙයි.

සන්නිවේදනය සිදුවන්නේ වචන හරහා පමණක් නොවේ. චිත්‍ර මගින් සංගීත ඛණ්ඩ මගින් ආදී වශයෙන් ද සන්නිවේදනය වෙයි. මේ සෑම අවස්ථාවක දී ම සංස්කෘතිය නොදැන සන්නිවේදනය සිදු නොවෙයි. මහ මග ඇති විවිධ සංකේත සන්නිවේදනය සඳහා යොදා ගැනෙයි. පාසලක් ළඟ ඇති බව සන්නිවේදනය කෙරෙන සංකේත ගැන අපට අවබෝධයක් ඇත. එවැනි සංකේතයක් ඇතැම් සංස්කෘතියක වෙනත් දෙයක් හඟවන චිත්‍රයක් විය හැකි ය. ඇතැම් විටෙක එවැනි චිත්‍රයක් මගින් පාසලක් නොව වෙනත් යමක් සන්නිවේදනය කෙරෙනවා විය හැකි ය. හුදු චිත්‍ර, හුදු ඝෝෂා යනුවෙන් ගත හැකි යමක් නැත. ඇතැම් විට චිත්‍රයක් පුදුමය උපදවන්නක් විය හැකි ය. සිංහල සංස්කෘතිය ගැන අවබෝධයක් නැති අයකුට ඒ මිනිහා බල්ලෙක් යනුවෙන් කියැවෙන වාක්‍යයෙන් ඇතැම් විට පුදුමයක්, කුහුලක් ඇඟවෙයි. එවැන්නකුට කොත්තු ඝෝෂාව කන්දොස්කිරියාවක් විය හැකි ය. එසේත් නැත්නම් ඒ ශබ්දය ප්‍රියජනක එකක් වීමට ඉඩ ඇත. ළදරුවන් සම්බන්ධයෙන් වුව ද ඇතැම් ඝෝෂා  ප්‍රියජනක විය හැකි ය. නැත්නම් බිය ගෙන දෙන සුළු විය හැකි ය. ළදරුවාට ඒ ඒ හැඟීම් ජනිත කරන්නේ සංස්කෘතිය නොවිය හැකි ය. ඒ ජෛවීයව, සාංසාරිකව උපදින හැඟීම් යැයි නිගමනය කළ හැකි ය. සෑම හැඟීමක් ම, සන්නිවේදනයක් ම සංස්කෘතියෙන් පමණක් නිර්ණය වන්නේ යැයි සිතීම වැරදි ය.

අපි දැන් නිව්ටන්ගේ තුන්වැනි නියමය යැයි හැඳින්වෙන්න ගනිමු. ඕනෑම ක්‍රියාවකට ම ප්‍රතික්‍රියාවක් ඇත යන්න ඇතැමකුට සූර්යයා පෘථිවිය මත බලයක් ඇති කරන්නේ නම් පෘථිවිය සූර්යයා මත එයට ප්‍රතිවිරුද්ධ බලයක් යොදන්නේ ය යන අදහස ගෙන දෙයි. එහෙත් මෙය නිවැරදි නොවේ. තවත් සමහරකු මේ ප්‍රතික්‍රියාව කර්මය සමග හඳුනාගැනීමට උත්සාහ කරනු දැක ගත හැකි ය. යමකු යම් ක්‍රියාවක් සිදු කළහොත් එයට විපාකයක් ඇත යනුවෙන් එහි දී ප්‍රතික්‍රියාව යන්න අර්ථ විවරණය කෙරෙයි. එහෙත් එය ද වැරදි ය. බිලියඩ් බෝල, භෞතීය වූ අංශු ආදිය සම්බන්ධයෙන් යොදා ගැනෙන නිව්ටන්ගේ තුන්වැනි නියමය කෙසේවත් සංසාරය සම්බන්ධ කටයුතුවලදී යොදා ගත නොහැකි ය. සංසාරයට තබා පෘථිවිය හා සූර්යයා අතර අන්තර්ක්‍රියාවටවත් තුන්වැනි නියමය වලංගු නොවේ. තුන්වැනි නියමය වලංගුවන්නේ එකිනෙක ස්පර්ශවන වස්තු සම්බන්ධයෙන් පමණකි. පෘථිවිය හා සූර්යයා යනු එකිනෙක සමග ගැටෙන වස්තු දෙකක් නොවේ. එබැවින් එහි දී ද තුන්වැනි නියමය වලංගු නොවේ.  එසේ වුව ද ඒ ඒ පුද්ගලයා තම තම නැණ පමණින් යම් යම් වචන සඳහා හෝ යම් යම් චිත්‍ර සඳහා හෝ වෙනත් යමක් සඳහා හෝ යම් යම් අර්ථකථන ඇති කර ගනියි. එනම් යම් විඥානයක් ඇති කර ගනියි. ඒ විඥානය චිත්‍රයෙන් හෝ වචන මාලාවෙන් හෝ වෙන්කර ගත හැකි නොවේ.

මෙයින් කියැවෙන්නේ වචන සම්බන්ධයෙන් සංඥායක හා සංඥායිත ලෙස ගැනීම ම වැරදි බව ය. පළමුවෙන් ම කිව යුත්තේ මේ ප්‍රකාශය වුව ද නිරපේක්ෂ වූවක් නොවන බව ය. ඒ ප්‍රකාශය ද මා කරන්නේ මගේ සංස්කෘතිය තුළ එනම් සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ ය. චක්ඛු විඥානය හෝ වෙනත් විඥානයක් හෝ ඇති වන්නේ කෙසේ ද යන්න ගැන සිංහල බෞද්ධයනට දැනුමක් ඇත. යමක් දැකීම හෝ ඇසීම හෝ සමග අදාළ විඥානය ඇතිවෙයි. යමක් දැකීම යනුවෙන් සඳහන් වුව ද ඒ දකින දැය නිර්මාණය වන්නේ දැකීමත් සමග ය. දැකීම සඳහා යමක් නැත. එසේ යමක් ඇති බව පිළිගැනීම ම ආත්මවාදී වෙයි. සියළු ආකාරයේ විඥානවාදී මෙන් ම භෞතිකවාදී දර්ශන ආත්මවාදී වෙයි. සංඥායකය හා සංඥායිතය යනුවෙන් කොටස් දෙකකට කැඩීම ම වැරදි ය.

මෙය තව දුරටත් විග්‍රහ කරමු. මාර්ග සංඥා සඳහා යෙදෙන රතු හා වෙනත් වර්ණ සංඥාවන් සලකන්න. මෙහි රතු යන වර්ණයෙන් කියැවෙන්නේ වාහනය නතර කරන්න යන්න ය. එය සංකේතයකි. එය පාසලක් අසල ඇති පාසල හඟවන සංකේතය වැනි සංකේතයකි. අප මතක තබා ගත යුතු කරුණ නම් සංකේතවලින් යමක් හඟවන්නේ, සන්නිවේදනය කෙරෙන්නේ යම් සංස්කෘතියක් තුළ බව ය. වෙනත් සංස්කෘතියක ඉන් වෙනත් දෙයක් හඟවනු ඇත. නැත්නම් හැඟීමක් ඇති කෙරෙනු ඇත. නැතහොත් ඒ කාර්යයන් දෙකම සිදු කෙරෙනු ඇත. රතු යන සංකේතයෙන් වාහනය නවත්වන්න යන්න හැඟවෙන්නේ එය සංකේතයක් ලෙස ගත් විට ය. මාර්ග සංඥා බටහිරයන් විසින් ලංකාවට හඳුන්වා දෙනු ලැබීමට පෙර රතු යන්න සිංහලයන්ට තවත් පාටක් විය. මාර්ග සංඥාවක් වුවත් නැතත් රතු

© Prof. Nalin De Silva

යන්න වර්ණයකි. එයින් අපට යමක් කියැවෙයි. අපි රතු පාට මල් ගැන දනිමු. ඇතැම් අවස්ථාවල ඉර රත්පැහැ වන අයුරු අපි දැක ඇත්තෙමු. රතු යන චක්කුවිඥානය අපට ලැබෙන්නේ රතු යන වචනය ද නැතිව ය. අපේ සංස්කෘතිය තුළ අපි එය රතු යනුවෙන් හඳුනා ගනිමු. වාහන පදවන්නන් සඳහා රතු සංකේතයක් වන්නේ ද්විතීයිකව ය.

දැන් රතු යන වචනය ගන්න. එය සංඥායකයක් ද? රතු යනු ශබ්ද මාලාවකි. එහෙත් ඒ ශබ්ද මාලාව හුදු සංකේතයක් නොවේ. රතු යන ශබ්ද මාලාව නිර්මාණය කරගෙන ඇත්තේ ම රතු පාට මල් ආදිය ගැන කීමට ය. මුල දී එය හුදු සංකේතයක් වන්නේ නොවේ. භාෂාවක් නොතිබූ මිනිසුන්ට ද චිත්ත රූප වෙයි. මේ චිත්ත රූප සඳහා යම් යම් ශබ්ද මාලා නිර්මාණය කෙරී ඇත්තේ ඒ චිත්ත රූප සන්නිවේදනය කිරීමට ය. මේ ශබ්ද මාලා වියුක්ත වෙයි. එසේ නොමැතිව ශබ්ද මාලා නිර්මාණය කර ගත නොහැකි ය. රතු පාටේ ඇති රතු බව යම් ශබ්ද මාලාවකින් ඒ ආකාරයෙන් දිය නොහැකි ය. රතු යන ශබ්ද මාලාවට පැහැයක් නැත. එහෙත් රතු යන වචනය නිර්මාණය කෙරී ඇත්තේ හුදු සංකේතයක් ලෙස නොවේ. රතු යන ශබ්දය ඇසුණු විට අපට රතු පාට සිතේ මැවෙයි. එය හුදු සංකේතයක් නොවේ. හුදු සංකේතයක් නොවුවත් එයට සංකේතයක් යැයි ඇතැම් විට කිව හැක්කේ කිසිදු පැහැයක් නැති ඒ වචනය වර්තමාන සිංහල සංස්කෘතියෙහි රතු පාට සමග බැඳී ඇති බැවින් ය. ඒ හැරෙන්නට එය වාහන නැවැත්වීම සංඥා කරන ආකාරයේ හුදු සංකේතයක් නොවේ. එබැවින් රතු යන වචනය හුදු සංකේතයක් හෝ සංඥායකයක් ලෙසත් ඉන් හැඟවෙන වර්ණය සංඥායිතය ලෙසත් ගැනීම වැරදි ය. මෙහි දී සංඥායකය හා සංඥායිතය යනුවෙන් වෙන්කර ගැනීම සොසූර විද්වතා හා අනෙක් බටහිර පශ්චාත්ව්‍යුහවාදීන් කරන වැරැද්ද ය. මාර්ග සංඥාවක් ලෙස රතු භාවිතා කිරීමේ දී නම් රතු වර්ණය හුදු සංකේතයක් ලෙස යොදා ගැනෙයි. එහි දී රතු යන්නෙන් වාහනය නවත්වන්න යන්න සන්නිවේදනය වෙයි. මේ අවස්ථා දෙකෙහි ඇති වෙනස තේරුම් ගැනීමට උත්සාහ කළ යුතු ය. බටහිරයන් කී පමණින් ඒ අවස්ථා දෙකෙහි වෙනස නැති කර ගත යුතු නොවේ. බටහිර පශ්චාත්නූතනවාදීන්ට මේ අවස්ථා දෙක අතර වෙනසක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva